රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කරගැනීමේ ප්‍රධාන අභිලාෂය පෙරදැරිව ජනවාරි 08වෙනිදා ලක්ෂ 62ක ජනතාවක් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්වී පත් කරගන්නා ලද අලුත් ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ජනතාව තුළ අවිශ්වාසය, අසතුට සහ කලකිරීම මෝදු වෙමින් පවතී. මහින්ද රාජපක්ෂ පාලනය පෙරළා විපක්ෂයේ පොදු අපේක්ෂකයෙකුගේ නායකත්වයට රට බාර කරන්නට රටේ සිවිල් ප්‍රජාව පෙළ ගැස්වූ මහා නායකයාණෝ පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමිපාණන් සමඟ ඒ පිළිබඳ අප කළ සාකච්ඡාවකි මේ.



# හදිසි මැතිවරණ එපා. පොරොන්දු ඉෂ්ට කරන්න

## පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි

**පසුගිය ජනාධිපතිවරණයෙන් රටේ සිදුවූ දේශපාලන බල පෙරළියට පාර කැපුව ප්‍රධානම සිවිල් බලවේගය වුණු සාධාරණ සමාජයක් සඳහා වන ව්‍යාපාරයට නායකත්වය දුන්නේ ඔබවහන්සේ. එහිදී පසුගිය කාලය පුරාම රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කිරීම සඳහා පෙනී සිටි ඔබවහන්සේත නව ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු කිසියම් ආකාරයකට නොපෙනී ගියා. සිවිල් බලවේගයේ ඉල්ලීම්ද කිසියම් ආකාරයකට යටපත්ව ගොස් ඇති බවයි පෙනෙන්නේ. එහෙම වුණේ කොහොමද?**

සාමාන්‍යයෙන් අපිට පේන්නේ මැතිවරණයකදී තරඟයට ඉදිරිපත් වෙන්නේ එක්සත් ජාතික පක්ෂය වටා එක්වුණු බලවේගයක් සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා එක්වුණු බලවේගයක්. නමුත් මෙවර ඉදිරිපත් වුණේ පොදු අපේක්ෂකයෙක්. ඒ කටයුත්ත සඳහා අපි වසර ගණනාවක් වෙහෙස වුණා. රටට යහපාලනයක්, සාධාරණයක්, ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කරගැනීම සඳහායි අපි එලෙස කටයුතු කළේ. ඒ සඳහා අපි තෝරාගත් අපේක්ෂකයා මෛත්‍රීපාල සිරිසේන මහතා තරඟයට ආවේ සියලු පක්ෂවල ආශිර්වාදය ඇතුව.

අපි ඉල්ලුව මූලික කාරණාව 78 ව්‍යවස්ථාවෙන් ඇති කළ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. ඒ වගේම ස්වාධීන කොමිසන් සභා ක්‍රියාත්මක කරන්න. 18වෙනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා 17 වෙනි සංශෝධනය ක්‍රියාත්මක කරන්න. මේ සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අවශ්‍ය සංශෝධන නව රජය බලයට පත්වෙලා මාස හයක් ඇතුළත සිදුකරන්න කියලයි අපි ඉල්ලා සිටියේ. අපි එහෙම ඉල්ලුවාට ඒ අය විසින්ම සාකච්ඡා කරලා කිව්වා ඔය ටික කරන්න අපිට හය මාසයක් අවශ්‍ය නෑ. දවස් සීයකින් කරගන්න පුලුවන් කියලා. මේකේ බැරෑරුම්කම සළකලයි අපි හය මාසයක් කියලා කිව්වේ. නමුත් ඒ අය අපිට වඩා මේ දේශපාලන කාරණා ගැන පරිණත බුද්ධියක් ඇති අයනේ. ඒ නිසා අපි කිව්වා පුලුවන් නම් දින සීයෙන් නෙවෙයි සුමානෙන් වුණත් හොඳයි කරන්න කියලා. ඔය බලාපොරොත්තුව ඔලුවේ තියාගන තමයි ජනතාව හරීම සතුටෙන් ජනාධිපතිවරණයට මුහුණ දුන්නේ. බඩු මිල අඩුකරනවා. පාන් පිටි මිල අඩුකරනවා. ඒවාට නෙවෙයි මිනිස්සුන්ගේ වුවමනාව තිබුණේ. මේ ව්‍යවස්ථා උගුලෙන් ගැලවෙන්නයි. ඒ බලාපොරොත්තුවෙන් ජනතාව මේ ආණ්ඩුව පත් කරගත්තාට මොකද තවම ඒ මූලික කටයුත්තට අත ගහපු බවක් පේන්නේ නෑ.

**ගැටළුව තියෙන්නේ එතනයි. නමුත් ආණ්ඩුව ඒ ගැන කතා කරන්නේ නැහැ. ජනතාවට සහනදීම ගැනයි කතා කරන්නේ?**

ජනාධිපතිවරණයෙන් පසුව සෑහෙන වෙනසක් ඇතිවුණා ඇත්ත. ඒ ගැන අපි සතුටු වෙනවා. ජනාධිපතිවරයාගේ අසීමිත නාස්තිකාර වියදම් අඩුකළා. ජෙනරාල් සරත් ෆොන්සේකා, හිටපු අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක වැනි අයට සාධාරණය ඉෂ්ට කළා. ජනතාවට සහන සැළසුව අය-වැයක් ආවා. තෙල් මිල අඩුවුණා. ගෑස් මිල අඩුවුණා. කිරිපිටි මිල අඩුවුණා. ආහාර වර්ග ගණනාවක මිල අඩුවුණා. ගතවුණු කාලය ඇතුළේ ඒ විදිහේ හුඟාක් හොඳ වැඩ සිද්ධ වෙලා තියනවා. ඒ ටිකට අපි රජයට ප්‍රශංසා කරනවා.



සංවාද සටහන
ශ්‍රීලාල් සෙනෙවිරත්න

නමුත් ඔයිට වඩා දෙයක් ජනතාව අපේක්ෂා කළා. ආණ්ඩුව තාම අත්‍යාවශ්‍ය කාරණයට අත ගැහුවේ නෑ. පහුගිය ජනාධිපතිවරණයේදී හැම කථිකයාම කතා කළේ අල්ලස්, දූෂණ වංචා ගැන. කතා කළා පමණක් නෙවෙයි පොත් පත් පවා ලියා ප්‍රසිද්ධ කළා. මිනිස්සුන්ට දැණුනා බඩු මිල ඉහළ ගිහිල්ලා අපි මේ ආකාරයෙන් දුක් විඳින්නේ අපේ ධනස්කන්ධය මේ ආකාරයෙන් හොරාකාපු නිසා නේද කියලා. මේ අපරාධ කරපු කොල්ලකාරයෝ අල්ලගෙන නීතිය ඉදිරියට ගෙනල්ලා අපෙන් කොල්ලකාපු ධනය ආපසු ලබාදුන්නොත් කියලා කතා වුණා. නමුත් මූලික කාරණය මගහැරෙමින් යනවා.

**දැන් ආණ්ඩුව කියන්නේ ඒ කාරණා ඉෂ්ට කරන්න දින 100 මදි කියලයි.**

මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනේ කියලා කියනවා. ඒක ටිකක් දුෂ්කර වැඩක්. ඉතිං මේ වෙනකොට ඒවා පටන් අරගෙන තියෙන්න ඕනේ. නමුත් ඒක පටන් ගත්තේ නෑ. ඒ වගේම අල්ලස් සහ දූෂණ වංචා සම්බන්ධයෙන් කෙරෙන කටයුතුවල මහ මළානික බවක් පෙනෙනවා. කොමසාරිස්වරයා කියනවා මට අවශ්‍ය සේවක සංඛ්‍යාව නෑ කියලා. වාහන නෑ කියලා. මගේ ඔළුවටත් උඩින් ෆයිල් කන්දක් ගොඩගහලා තියනවා. කියලා බොහොම කණගාටුදායකව කතා කරනවා. ඉතිං ප්‍රමුඛ මාතෘකාව මේක නම් ඒකටනේ මුල් තැන දෙන්න අවශ්‍යය. මේවා කල් යනකොට මොකද වෙන්නේ? හැම හොරාම තමන් නිදහස් වෙන්න දේවල් කරන්න පටන් ගන්නවා. මෙහෙම යනකොට ඕවයේ ෆයිල් නැතිවෙනවා.

වෙළේ සුදා කුඩු ගැන කතා කළා. දැන් තරුණ පරම්පරාවේ ලක්ෂයකට වැඩිය කුඩු වලට ඇබ්බැහි වෙලා. කුඩුයි, පෙතියි, මරුජුවානයි, ගංජයි, මේවා සියල්ලෙන්ම විනාශ වෙන්නේ රට. දැන් මේවා ප්‍රමාද කරන්න සුදුසු කාරණා නෙවෙයි. ලෙඩාට අමාරුයි. අන්තිමයි. පණ අදිනවා. ඒ නිසා මේවාට ක්ෂණික ප්‍රතිකාර දීම අවශ්‍ය වෙනවා.

වෙළේ සුදා කියනවා කෝටි ගාණක කුඩු ගෙනාපුවා ගැන. ඒවාට මොකද වුණේ. කෝ අර ගෝනි හතරක් අල්ලපු කුඩු. මොනවද වුණේ ඒවාට. ඒවාට අහපු නඩු කෝ. නඩුත් නෑ බඩුත් නෑ. මේ කුඩු ඔක්කොම ආයෙම ජනතාව අතරට ගියා. කල් යනකොට වෙන්නේ ඕක තමයි. මිනිස්සුන්ටත් ඕවා අමතකවෙලා යනවා. ඊට පස්සේ කිසිවක් සිද්ධ වෙන්නේ නෑ. මේවා කිසිවක් ප්‍රමාද කරන්න හේතු නොවෙයි. ප්‍රමුඛත්වය දිය යුතු කරුණු. රජය තීරණය කරන්න ඕනේ අපි ප්‍රමුඛත්වය දෙන්න ඕනේ මොනවටද කියලා. දින 100 වැඩසටහනට ප්‍රමුඛත්වය දෙන්න ඕනේ. ඒ වගේමයි තොරතුරු දැනගැනීමේ අයිතිය. අර කුඩු නඩුවට මොකද වුණේ? කෝ විභාගය? කෝ තීන්දුව? අපිට අයිතියක් තියෙන්න ඕනේ ඒවා දැනගන්න. දැනට එහෙම බලයක් අපිට නැහැ.

**දේශපාලන ප්‍රතිසංස්කරණවලට දින 100මදි කියලා ආණ්ඩුව කරන ප්‍රකාශ වලින් පැහැදිලි වෙන්නේ ඒවා කරගන්න වෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණයකින් පසුව පත්වෙන අලුත් ආණ්ඩුවකි න් කියන එක නේද?**

මේ තත්ත්වය තුළ රජයට සහයෝගය දෙන්න ඕනේ විවේචනාත්මකවයි. මොකද මේ රජයෙන්ම මේ ටික කරන්ගන්න වෙනවා. වෙන කාගෙන් කරගන්නද? ඒ සඳහා අපි පක්ෂ ආගම් ජාතිභේද නැතිව සියල්ලෝම එකාවගේ නැඟිටින්න ඕනේ. අනෙක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ වෙනස්කම් ටික කරන්න බෑ තුනෙන් දෙකක බලය නැතිව. නැවත මැතිවරණයකට ගියොත් යූඑන්පියටත් ආසන ටිකක් හම්බ වෙයි. ශ්‍රී ලංකා එකටත් ආසන ටිකක් හම්බ වෙයි. එතකොට කොහොමද අපි මේ ප්‍රශ්ණය විසඳාගන්නේ. මේ වෙලාවේ මේ ආණ්ඩුවෙන් මේක කරගත්තේ නැත්නම් ආය අපිට කවදාවත් මේක කරගන්න හම්බවෙන්නේ නෑ.

**දින 100න් අඩක්ම දැන් ගෙවී අවසන්. විපක්ෂයේ සහාය ලැබීමත් අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබෙනවා. ඉතිරි දින 50 තුළ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට අදාළව ඔය කියන කාරණා ඉෂ්ට කරගන්න පුලුවන් වෙයි කියලා ඔබවහන්සේ හිතනවාද?**

මේ වෙලාවේ අපි ජනාධිපතිතුමාට ආරාධනා කරනවා මේකට ප්‍රමුඛත්වය දෙන්න. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා වශයෙන්. අගමැතිවරයා එක්සත් ජාතික පක්ෂයෙන් ඉන්නවා. දෙන්නා එකතුවෙලා පක්ෂ දෙකේම සහභාගිත්වය ලබාගෙන ඉතාම ඉක්මනින් මේ ප්‍රශ්ණය විසඳාන්න ප්‍රමුඛත්වය දෙන්න කියන එක තමයි අපේ එකම ඉල්ලීම. කියපු ආකාරයෙන්ම සියල්ල කරන්න බැරි වුණත් මේවායින් කීපයක් හෝ කළ හැකියි. නොකළහොත් ජනතාවගේ දැඩි අප්‍රසාදයට පත්වෙන එක වළක්වන්න බෑ.

**ආණ්ඩුවට දින සීයකට වැඩිය කාලයක් දීම කිසිසේත් නොකළ යුතු බවටත් මතයක් ඉදිරිපත් වෙමින් පවතිනවා?**

මෙතනදි වඩා වැදගත් වෙන්නේ ජනතාව අපේක්ෂා කළ දේශපාලන වෙනස සිදුකර ගැනීම මිස ඒ සඳහා ගත වන කාලය නොවෙයි. මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට යම් බධාවක් තියනවා නම් ඒකට තව කාලයක් ගන්නවාට ජනතාව අකමැති නෑ. තවත් දින 100ක් ගන්න. ඊළඟට මහ මැතිවරණයක් පවත්වන්න ලබන අප්‍රේල් වෙනකම් අපිට කාලය තියනවා. අපි ඕකම තමයි මහින්ද රාජපක්ෂ මහත්තයාට කිව්වේ. ඔබතුමා මොකද කලබල වෙන්නේ මේ මැතිවරණ තියන්න. ඔබතුමාට තව අවුරුදු දෙකක් කාලය තියනවා. ඔබතුමා මේ කටයුත්ත ඉෂ්ට කරලා යන්න ජනතාව අතරට. ඔබතුමා වීරයෙක් වෙනවා. මේ

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com